# ජාතික ලුණු සමාගම

## මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික ලුණු සමාගම යනු මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක රජයට අයත් සමාගමකි. සමාගමේ අලිමංකඩ ලුණු ලේවායේ පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරු - පිරිවැය ගණකාධිකාරී - [MM 1-1]**

**(තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකාරණ / වාණිජ්‍ය / ව්‍යාපාර කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන උපාධියක් සහ අවම වසර එකක (01), රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, උපාධිය ලබාගැනීමෙන් පසුව පළපුරුද්ද.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත්වීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වසර එකක් පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබාතිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-1 GR II - 2016 රුපියල් [53,175-10x1,375-15-1,910-95,575] හා අනෙකුත් රජයේ අනුමත දීමනා (ජීවන අංක දීමනාව : රුපියල් 17,800/-, මාසික දීමනාව : රුපියල් 5,000/-, වෘත්තීය දීමනා : රුපියල් 3,000/-, දුරකථන දීමනාව : රුපියල් 2,000/-)

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**වෙනත් :**

සෑම අයදුම්කරුවකුම :

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට අදාළ රාජකාරි නිසියාකාරව ඉටුකිරීම සඳහා හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීම සඳහා මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

- මෙම පත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණ වේ.
- අදාළ පරිවාස කාලය වසර තුනකි.
- මෙම කාර්යයට යම් බලපෑම් සිදුකිරීම අයදුම්කරු නුසුදුසු භාවයට පත්කිරීමට හේතුවනු ඇත.

කරුණාකර, ඔබගේ අයදුම්පත්, සියලු ජීවදත්ත හා සහතිකවල පිටපත් සමඟ, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2024-04-21 දිනට පෙර ලැබීමට සලස්වන්න. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සාමාන්‍යාධිකාරී,**

**ජාතික ලුණු සමාගම,**

**අංක 561/3, ඇල්විටිගල මාවත,**

**කොළඹ 05.**

**011-2368974**